**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2018**
**-----------------------------------------------------------**

## 1.1 මතය

**-------**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වා ගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

----------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත<br>------------------------------ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය හා අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්ති අංක 4.8 අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවකාලය හා සුන්බුන් අගය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර වෙනසක් සිදු වන්නේ නම් එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 ප්‍රකාරව ගිණුම්වල ගැලපිය යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරිය සතු රු. 795,410,652 ක් වන දේපල, පිරියත හා උපකරණ සමාලෝචනයට භාජනය කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකග වේ. 2019 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයට අවශ්‍ය කටයුතු කරනු ඇත. | ප්‍රමිතය ප්‍රකාරව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතු වේ.. |

## 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව දීමනා ගෙවිය නොහැකි වුවත් අධිකාරිය කළමනාකරණ තනතුරු දරණ නිලධාරීන් 27 දෙනෙකු සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණයක් මත 2018 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මාසිකව රු. 50,000 ක් බැගින් කළමනාකරණ දීමනාවක් ගෙවා තිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකග නොවේ. මෙම ආයතනයේ ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂකවරුන්ගේ සහ කළමණාකරුවන්ගේ රාජකාරි ස්වභාවය අනුව ඔවුන්ගේ සේවය රාජකාරී වේලාවෙන් පරිබාහිරව යොදා ගත යුතු බැවින්, ඔවුනට තමන්ගේම වාහනයකින් රාජකාරියට ඒමට සහ යාමට හැකිවන පරිදි මෙම දීමනාව ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.<br><br>එම දීමනාවට පදනම් වී ඇත්තේ තමාගේම වාහනය භාවිතා කිරීම සම්බන්ධයෙන් වූ රු. 30,000/- ක මුදලක් ප්‍රවාහන දීමනාව වශයෙන් එම සේවක මණ්ඩලය වෙනුවෙන් ලබා දෙනු ලබන රු. 20,000/= ක දීමනාවන් යන දීමනා දෙක එකතු කිරීමෙනි. | නිලධාරීන් සඳහා නව දීමනා ලබාදීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින දක්වා මිලදී ගැනීම් වලට අදාලව අධිකාරියට ලැබිය යුතු එකතු කළ අගය මත යෙදවුම් බදු වටිනාකම රු. 152,208,634 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති මුදල අය කර ගැනීම පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වා තිබු නමුත් එම මුදල් අයකර ගැනීම පිළිබඳව මෙතෙක් අවසාන නිගමනයකට එළඹී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා දිගින් දිගටම සාකච්ඡා කළද මෙතෙක් අවසාන තීරණයක් ලබා දී නොමැත. | ලැබිය යුතු මුදල සම්බන්ධව අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර අවසාන එකඟතාවයකට පැමිණීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය | තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලගා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගැනීම සිදු කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකග වේ. මේ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක සපුරාලීමට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,300,143,061 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 1,042,914,458 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 257,228,603 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට විදේශ විකුණුම් අධිභාරය වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

i. පසුගිය වර්ෂයට සාපේක්‍ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 366,789,848 කින් හෙවත් සියයට 18.4 කින් වර්ධනය වී තිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේ සේවක මණ්ඩල පිරිවැය රු. මිලියන 312 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ රු. මිලියන 288 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසැදීමේදී සේවක මණ්ඩල පිරිවැයෙහි වැඩිවීම සියයට 8 ක් වූ අතර අතිකුත් දීමනා ගෙවීම් රු. මිලියන 25 කින් වැඩි වීම මේ සඳහා හේතු වී තිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ පරිපාලන හා අනෙකුත් වියදම් රු. මිලියන 171 වූ අතර එය ඉකුත් වර්ෂයේ රු.මිලියන 149 ක් විය. ඉකුත් වර්ෂය සමග_සැසැදීමේදී පරිපාලන වියදම් හා අනෙකුත් වියදම්වල වැඩිවීම සියයට 15 ක් වූ අතර බාහිර තාක්‍ෂණික සහයෝගයන් ලබා ගැනීම සඳහා ගෙවීම් රු. මිලියන 14 කින් වැඩිවීම මේ_සඳහා හේතුව වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

---------------------------

පහත සඳහන් නිරීක්‍ෂණ කරනු ලැබේ.

i. 2017 වර්ෂයේ ජංගම අනුපාතය 2.2:1 වු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එය 2:1 ක් ලෙස අඩු වී තිබුණි.

ii. වත්කම්, ස්කන්ධය හා වගකීම්වල සංචලනයන් සැලකීමේදී 2017 වර්ෂයට සාපේක්‍ෂව 2018 වර්ෂයේදී මුළු වත්කම් රු. 768,027,904 කින් හෙවත් සියයට 16 කින් හා ස්කන්ධය රු. 445,904,311 කින් හෙවත් 14.22 කින් වර්ධනය වී තිබූ අතර මුළු වගකීම් රු. 322,123,592 කින් හෙවත් සියයට 19.2 කින් වැඩි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ සියලු මෙහෙයුම් කාර්යයන් ආවරණය වන පරිදි අංශ 18 ක් හඳුනාගෙන ඊට අනුරූපී ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key performance Indicators) හඳුන්වා දී තිබූ නමුත් ඊට අනුකූලවන ආකාරයට කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණය අනුව කාර්ය සාධන වාර්තා පිළියෙළ කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් අනුව කාර්යසාධනය මැන බැලීම හා වෙනස්කම් සඳහා හේතු සමාලෝචනය කර අවශ්‍ය ප්‍රතිකර්ම යෙදීම කළමනාකරණයේ වගකීම ඉටුකල යුතුවීම. |
| (ආ) | අන්තර් ජාතික සිවිල් ගුවන්සේවා සංවිධානයේ විගණනය මගින් අධිකාරිය අවධානය යොමු කල යුතු කරුණු 70 ක් දක්වා තිබුණු අතර එම කරුණු සම්න්ධයෙන් නිවැරදි කිරීමේ සැලැස්මක් (**Corrective Action Plan)** සකස් කර එකඟ වූ කාල සීමාව අතුළත ඉහත සංවිධානය වෙත ඉදිරිපත් කල යුතුව පැවතුණි. මෙම විගණනයෙන් පෙන්වා දී තිබූ **Air Navigation Services** අංශයට අදාල කරුණු 36 න් 8 ක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ සැලසුම් (**Corrective Action Plan)** සකස් කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟවේ.<br><br>මෙම නිවැරදි කිරීමේ සැලසුම් සකස් කිරීමට අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන හා සම්බන්ධීකරණය අවශ්‍ය වේ. ඉතිරි කරුණු 28 සම්බන්ධයෙන් නිවැරදි කිරීම් සැලැසුම් පිළියෙළ කර ඇති අතර එම සැලසුම් අදාල ආයතන සමග සම්බන්ධීකරණය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. | කාලීනව නිවැරදි කිරීමේ සැලසුම් සකස් කර නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කල යුතු වේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියෙහි කටුනායක නව කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් වී කාර්යාල මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යමින් තිබුණද ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් උපදේශනය සඳහා මුදා හැර තිබු Civil Aviation Inspector (Aerodromes Standards) තනතුරට බඳවාගත් නිලධාරියා 2019 අප්‍රේල් 30 දක්වාද ව්‍යාපෘති කළමනාකරණ තනතුරෙහි කටයුතු සිදු කරන බව නිරීක්‍ෂණය විය. මේ හේතුවෙන් (Civil Aviation Inspector Aerodromes Standards) තනතුර පුරප්පාඩුව පවතින බවද නිරීක්‍ෂණය විය. | මෙම අධිකාරියේ නව කාර්යාල ගොඩනැගිල්ලේ තැනීම් කටයුතු නිම වුවද අඩුපාඩු නිම කිරීමට ඇති බැවින් සහ අදාල ගෙවීම් කටයුතු වල අධීක්ෂණය සඳහා කැලුම් වීරවර්ධන මහතාගේ සේවය ව්‍යාපෘති කළමනාකරු තනතුර සඳහා අවශ්‍ය බැවින් සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගගනයාත්‍රාංගණ ප්‍රමිති) තනතුරෙන් පූර්න කලීනව නිදහස්කර ඇත. | ගොඩනැගිල්ල භාවිතයට ගෙන වසර 1 ½ ක පමණ කාලයක් ගතවී ඇත. තවදුරටත් පූර්ණකාලීන නිලධාරියෙකුගේ අවශ්‍යතාවයක් වේදැයි ගැටලු සහිතය. මේ පිළිබඳ කළමනාකරණය අවධානය යොමු කල යුතු වේ |
| (ආ) | අධිකාරියේ තාක්‍ෂණික අංශයක් වන Aircraft registration and airworthiness අංශයේ අධ්‍යක්‍ෂක තනතුර 2018 ජූලි මාසයේ සිට හිස්ව (Vacant) පැවතුණි. | මෙම අධිකාරියේ ගුවන්යානා ලියාපදිංචි හා ගුවන් යෝග්‍යතා අංශයේ අධ්‍යක්ෂක තනතුර පුරප්පාඩු වුයේ 2018.09.04 දින සිටය. එම තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම් පත් කැඳවමින් 2018.09.02 හා 2018.09.03 යන දින වල ජාතික පුවත්පත් වල දැන්වීම් පල කර ඇති අතර මෙම අධිකාරියේ වෙබ් අඩවියේද දැන්වීම් පල කරන ලදී. ඒ අනුව සුදුසුකම් ලත් අයදුම්කරුවන් 05 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවූ අතර මෙහිදී ඉහත තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරු වයස අවුරුදු 60 ට වැඩි වූ බැවින් එම නිලධාරියාගේ ජීව දත්ත සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට 2018.11.05 දින ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට යොමු කරන ලදී. | තනතුරු පුරප්පාඩු පිරවීම කළමනාකරණයේ වගකීම වේ. |